## 385 සුවඳ ජලේ පිපී

සුවඳ ජලේ පිපි කුමුදිනියේ
ලංකා මල් පොකුණේ
ඔබව නෙලා අප රත්රතියේ
රුවට හොවා මුදුනේ
මල් පූජා කරමු ජේසුට ඔබව දෙමු
ඔබව තබා අප හිස මුදුනේ
අපි ජේසුට මල් පුදමු

පහන් දහක් දල්වා
හඳුන් කොකුම් ගල්වා
ජයෙන් මඟුල් බෙර ගසා නෙලා
ඔබ ඔබේ පුතුන් පුදමු

ලිය කුලයේ සිළුමිණි ලලනී
ඔබ වෙත අපි හැරෙමූ
ඔබෙ උණුසුම් තුරුළට පැමිණි
ජේසුට මල් පුදමූ

මල් මාලා ගොතලා ඉන් ඔබෙ පා ඔතලා
ඔබව තබා අප හිස මුදුනේ
අපි ජේසුට මල් පුදමු